ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවා සංගමය
இலங்கை கணக்காளர்கள் சேவைச் சங்கம்
SRI LANKA ACCOUNTANTS' SERVICE ASSOCIATION
Reg No : 324

මගේ අංකය: SAcSA/2026/2027- M-13 දිනය: 2026.11.15

ගරු ජනාධිපති සහ මුදල්, ක්‍රම සම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍ය,
අනුර කුමාර දිසානායක මැතිතුමා
ජනාධිපති ලේකම් කාර්යාලය,
කොළඹ 01.

ගරු ජනාධිපතිතුමනි,

2027 අයවැය මගින් යෝජිත දීමනා හේතුවෙන් රාජ්‍ය සේවයේ විධායක ශ්‍රේණි අතර උද්ගත වී ඇති දීමනා විෂමතාව නිවැරදි කිරීම සහ සමස්ත රාජ්‍ය සේවයම සඳහා සාධාරණ දීමනාවක් ලබා දීම පිළිබඳවයි.

2026 නොවැම්බර් 12 වන දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද 2027 අයවැය යෝජනා මගින් රාජ්‍ය මූල්‍ය විනය ශක්තිමත් කිරීමට සහ රාජ්‍ය සේවයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට රජය ගෙන ඇති සාධනීය පියවර අප සංගමය අගය කර සිටිමු.

02. එසේ වුවද, මෙම අයවැය තුළින් සමස්ත රාජ්‍ය සේවයම ආවරණය වන පරිදි ඉහළ ගිය ජීවන වියදමට සරිලන සාධාරණ මූල්‍ය සහනයක් ලබා දීම වෙනුවට, රාජ්‍ය සේවයේ ඉතා සීමිත පිරිසක් පමණක් ඉලක්ක කර ගනිමින් දීමනා සංශෝධනය කිරීම තුළින් සමස්ත විධායක සේවාවන් අතර මෙන්ම ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ (SLAcS) නිලධාරීන්ටද බරපතළ අසාධාරණයක් සහ ව්‍යාකූලත්වයක් නිර්මාණය වී ඇති බව කණගාටුවෙන් දන්වා සිටිමු.

03. **වැටුප් කොමිෂන් සභාව කෙරෙහි තැබූ විශ්වාසය සහ උද්ගත වූ විෂමතාව**

2026 ජුනි 22 දිනැති අංක 2494/05 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ස්ථාපිත කරන ලද වැටුප් හා විශ්‍රාම වැටුප් කොමිෂන් සභාව මගින් සමස්ත රාජ්‍ය සේවයේම වැටුප් හා දීමනා විෂමතා පිළිබඳ නිවැරදි හා සාධාරණ විශ්ලේෂණයක් සිදු කර විසඳුම් ලබා දෙනු ඇතැයි යන විශ්වාසය මත අප සංගමය මෙතෙක් වෙනම වැටුප් හෝ දීමනා වැඩිවීම් ඉල්ලා සිටීමෙන් වැළකී සිටියෙමු.

04. මෙවැනි පසුබිමක් තුළ ඔබතුමා විසින් 2027 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද අයවැය යෝජනාව තුළින් රාජ්‍ය සේවයේ සීමිත වූ කණ්ඩායමක් වෙනුවෙන් දීමනා ලබාදීමට යෝජනා කරන ලදී. එලෙස සීමිත වූ කණ්ඩායමක් වෙනුවෙන් දීමනා ලබාදීම සඳහා රජය විසින් ගනු ලැබූ තීරණය සම්බන්ධයෙන් අපගේ අප්‍රසාදය මේ අවස්ථාවේ දී ප්‍රකාශ කර සිටින්නෙමු. එයට හේතුව වනුයේ රාජ්‍ය සේවයේ සියලුම නිලධාරීන්ට අධික ජීවන බරක් පවතින වකවානුවක මෙලෙස සීමිත වූ කණ්ඩායමකට දීමනා යෝජනා කිරීම කිසිසේත්ම සුදුසු නොවන ක්‍රියාවක් වනු ඇත.

05. රාජ්‍ය මූල්‍ය කළමනාකරණයේ කොඳු නාරටිය වන ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධාරීන්ගේ වෘත්තීය ගරුත්වය ආරක්ෂා කිරීමටත්, සේවාව තුළ නිලධාරීන් රඳවා ගැනීමටත් (Retention),පහත සඳහන් කරුණු ද ඔබතුමාගේ කාරුණික අවධානයට ලක් කරන්නෙමු.

05.1 **II සහ III ශ්‍රේණිවල රාජකාරී ඉටු කරනු ලබන නිලධාරීන් මුහුණ දෙන ප්‍රායෝගික අසාධාරණය**

1999.10.08 දිනැති 22/99 සහ 2017.07.11 දිනැති 22/99 (xxxiii) චක්‍රලේඛ අනුව නියෝජ්‍ය/සහකාර මට්ටමේ තනතුරු දරන දීපව්‍යාප්ත සේවා නිලධාරීන්ට කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් සඳහා හිමිකම් තිබුණද, වර්තමානයේ පවතින සංචිත වාහන හිඟය, ඉන්ධන සීමාවන් සහ වාහන ආනයන සීමා හේතුවෙන් සහනදායී වාහන බලපත්‍ර අහිමි වීම මත එම නිලධාරීන් දැඩි දුෂ්කරතාවයකට පත්ව සිටිති. 2024 වසරේදී රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ප්‍රතිපත්තිමය එකඟතාවය සහිතව මුදල් අමාත්‍යාංශය වෙත යොමු කළ කෙටුම්පත් චක්‍රලේඛය මගින් යෝජනා කළ පරිදි මෙම නිලධාරීන්ට මාසික ප්‍රවාහන දීමනාවක් ලබා දීමෙන්, සංචිත වාහන නඩත්තුව වෙනුවෙන් රජය දරන අධික පිරිවැය අවම කර ගත හැකි බැවින් මෙම නිලධාරීන්ට මාසික ප්‍රවාහන දීමනාවක් ලබා දීම රජයට අමතර වැය බරක් නොවන බවත් අපි අවධාරණය කරන්නෙමු.

05.2 **මූර්ත වැටුප් බෑදනය සහ රාජ්‍ය මූල්‍ය අංශයේ බුද්ධි ගලනය (Brain Drain)**

2016 වැටුප් ව්‍යුහයෙන් පසු ඇති වූ සමුච්චිත උද්ධමනය හේතුවෙන් විධායක නිලධාරීන්ගේ මූර්ත වැටුප් වටිනාකම 50% කට වඩා පහත වැටී ඇත. ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධාරීන් යනු වරලත් ගණකාධිකාරී (CA, CIMA, ACCA, CMA) සහ පශ්චාත් උපාධි සුදුසුකම් සපුරාලූ ඉහළ වෘත්තීය නිපුණතාවයක් ඇති පිරිසකි. තම වෘත්තීය වගකීමට සහ අධ්‍යාපන සුදුසුකම්වලට සරිලන වැටුපක් හා දීමනා නොලැබීම හේතුවෙන්

05.2.1 2022–2025 කාලසීමාව තුළ ශ්‍රී ලංකාවෙන් විදේශගත වූ වෘත්තීයවේදීන් 45,000 කට අධික සංඛ්‍යාව අතර රාජ්‍ය අංශයේ ගණකාධිකාරීවරුන් විශාල පිරිසක් ද වෙති.

05.2.2 14/2022 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය යටතේ වැටුප් රහිත විදේශ නිවාඩු ලබා ගැනීම සහ සේවයෙන් ඉල්ලා අස්වීම හේතුවෙන් මේ වන විට ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ අනුමත කාර්ය මණ්ඩලයෙන් සැලකිය යුතු පුරප්පාඩු ප්‍රමාණයක් නිර්මාණය වී ඇති අතර, ඉතිරි නිලධාරීන් මත අධික රාජකාරී ප්‍රමාණයක් පැටවී තිබේ.

05.2.3 එසේම වෘත්තිකයින් වශයෙන් ගණකාධිකාරී සේවයේ නිලධාරීන්ට දැරීමට සිදුවන වගකීමට සාපේක්ෂව නිසි වැටුප් ව්‍යුහයක් නොමැති වීම හේතුවෙන් රජයේ ගණකාධිකාරී සේවයට ඇතුළත් වන පිරිස ද සැළකිය යුතු ලෙස අඩු වී ඇත.

06. අපගේ **යෝජනා**

2027 අයවැය යෝජනා තුළින් අප සංගමයේ සාමාජිකයන් හට සහ සමස්ථ රාජ්‍ය සේවය සඳහා සිදු වී ඇති අසාධාරණයන් සම්බන්ධව මෙහි පහත සඳහන් යෝජනා 2027 අයවැය කාරක සභා අවස්ථාවේදී නැවත සළකා බැලීමට කටයුතු කරන ලෙස ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලා සිටින්නෙමු.

06.1 **විධායක / වෘත්තීය දීමනාව ඉහළ නැංවීම:**

ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ සියලුම ශ්‍රේණිවල නිලධාරීන් දරනු ලබන පුළුල් මූල්‍ය වගකීම සහ කාර්යභාරයේ සංකීර්ණත්වය සැලකිල්ලට ගෙන, දැනට ගෙවනු ලබන වෘත්තීය/විධායක දීමනාව **රු. 50,000/- දක්වා** ඉහළ නැංවීම.

06.2 **II සහ III ශ්‍රේණිවල රාජකාරී ඉටු කරනු ලබන නිලධාරීන් සඳහා ප්‍රවාහන දීමනාවක් ලබා දීම:**

නිල වාහන හිමිකමක් නොමැති සහ වාහන බලපත්‍ර වරප්‍රසාදය භුක්ති විඳීමට නොහැකි වී ඇති ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ II සහ III ශ්‍රේණිවල සියලුම නිලධාරීන් සඳහා (2024 වසරේ මුදල් අමාත්‍යාංශය වෙත යොමුකළ කෙටුම්පත් චක්‍රලේඛය ද පදනම් කර ගනිමින්) 2027.01.01 දින සිට අවම වශයෙන් රු. 50,000/- මාසික ප්‍රවාහන සහන දීමනාවක් ලබා දීම.

06.3 **සමස්ත රාජ්‍ය සේවයට සාධාරණ ජීවන වියදම් දීමනාවක් ලබා දීම:**

අංක:10/2025 දරණ රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛය අනුව 2027 ජනවාරි සිට සමස්ත රාජ්‍ය සේවයේම වැටුප් වැඩි වීමක් සිදු වුවද, රාජ්‍ය සේවයේ විධායක නොවන මට්ටමේ නිලධාරීන් සඳහා එම වැඩි වීම ඉතාමත් පහළ අගයක් වන බැවින් සහ මේ වන විට උද්ධමනය 8% කට වැඩි අගයක් පවතින බැවින් එම අගය ද සැලකිල්ලට ගෙන, ඉහළ ගොස් ඇති ජීවන වියදමට සරිලන පරිදි සමස්ත රාජ්‍ය සේවකයින් හට **රු. 25,000/-** ක ජීවන වියදම් දීමනාවක් ලබා දීම.

ඉහතින් දක්වා ඇති කරුණු හා අප විසින් කරනු ලබන යෝජනාද සැලකිල්ලට ගෙන, රාජ්‍ය අංශයේ මූල්‍ය විනය, විනිවිදභාවය සහ ජාතික සංවර්ධන ව්‍යාපෘතිවල සාර්ථකත්වය සෘජුවම රඳාපවතින්නේ ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධාරීන් තුළින් බැවින්, අයවැය කාරක සභා අවස්ථාවට පෙර මේ පිළිබඳව ඔබතුමා සමඟ සාකච්ඡා කිරීමට කඩිනමින් අවස්ථාවක් ලබා දෙන මෙන් ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටින්නෙමු.

මෙයට විශ්වාසී,

ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවා සංගමයේ විධායක කමිටුව වෙනුවෙන්,

සී.පී.ලොකුගලප්පත්ති
සභාපති

බී.එම්.එල්.එස්. බාලසූරිය
ලේකම්

පිටපත් 01. ගරු ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා - ඔබතුමාගේ කාරුණික අවධානය සඳහා
02. ජනාධිපති ලේකම්- ජනාධිපති ලේකම් කාර්යාලය - කාරුණික අවධානය සඳහා
03. ලේකම් - මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය - කාරුණික අවධානය සඳහා

President : C.P.Lokugalappaththi
Contact : 071 8031295

Secretary : B.M.L.S. Balasooriya
Contact : 071 4427925

Treasurer : A. Uthayarajan
Contact : 077 7567988

Postal Address : No.259/9, Balummahara,Imbulgoda,Gampaha.
E-Mail : slaccsa324@gmail.com